ASDA 2016
පර්යේෂණ පත්‍රිකා
ඇසුරිනි




# ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාර බෝග ආශ්‍රිත බීජ මඟින් පැතිරෙන රෝග හඳුනා ගනිමු




වගාවන් සඳහා රෝග ආසාධිත බීජ යොදා ගැනීම හේතුවෙන් බීජ පැළ නොවීම, බීජ පැළ වල දිරිය අඩුවීම, රෝග කාරක ජීවීන් නව පරිසර වෙතට පිවිසීම සහ ව්‍යාප්තිය සඳහා ඉඩකඩ සැලසීම මෙන්ම රෝග මර්ධනය සඳහා අධික වියදමක් දැරීමට සිදුවිය හැකිය. එමෙන්ම, රෝග කාරක ජීවීන්ගේ ආසාධනය හේතුවෙන් ලැබෙන අස්වැන්න ප්‍රමාණාත්මකව අඩුවිය හැකි අතරම ඇතැම් රෝගකාරක ජීවීන් මගින් ශ්‍රාවය කරනු ලබන මයිකොටොක්සින් වැනි විෂ සහිත සංයෝග නිසා අස්වැන්න පරිභෝජනයට නුසුදුසු තත්ත්වයට පත්වීම ද සිදුවිය හැකිය.

ලෝකයේ වවනු ලබන ආහාර බෝග වලින් 90% ක පමණ ප්‍රමාණයක් ප්‍රචාරණය කරනු ලබන්නේ බීජ මගිනි. එබැවින් ඉහළ ගුණාත්මයෙන් යුතු නිරෝගී බීජ, වගාව සඳහා යොදා ගැනීම සාර්ථක බෝග වගාවක් සඳහා මූලික අඩිතාලම වේ. ශ්‍රී ලංකාවේ බීජ නිෂ්පාදනය, ආනයනය සහ අලෙවිය සඳහා රාජ්‍ය ආයතන, පුද්ගලික ආයතන සහ ගොවි සංවිධාන ආදී විවිධ පාර්ශවයන්ගේ සහභාගීත්වයක් දක්නට ලැබේ. එමෙන්ම බීජ මගින් බෝග වගාවන් තුළට ඇතුළු වූ සහ හානිදායක ලෙස පැතිරී ගිය රෝග කාරකයින් පිළිබඳව ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වලින් වාර්තා වී ඇත.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සෞඛ්‍ය පරීක්ෂණ ඒකකය මගින් රාජ්‍ය ආයතන, පුද්ගලික ආයතන සහ ගොවි මහතුන් ශ්‍රී ලංකාව තුළ වගාකරනු ලබන සහ ආනයනය කර බෙදාහරිනු ලබන වී, අතිරේක ආහාර බෝග, ප්‍රධාන එළවළු බෝග සහ පැණි කොමඩු යන බෝගයන්ට අයත් බීජ ගණනාවක් බීජ මගින් පැතිරෙන රෝග සඳහා පරීක්ෂා කරන ලදී. එම පරීක්ෂාවන් හිදී එම බෝග වල බීජ ආශ්‍රිතව පැවති, බීජ මගින් පැතිරීමේ හැකියාව ඇති සහ වගාවන්ට ඉතාමත් හානිදායක විය හැකි දිලීර, බැක්ටීරියා සහ වෛරස් යන කාණ්ඩවලට අයත් රෝගකාරක ජීවීන් 20 ක් හඳුනාගෙන ඇත. එම රෝගකාරක ජීවීන් සහ එම ජීවීන් මගින් හානිකරනු ලබන බෝග වර්ග පහත වගුවේ දැක්වේ.

| බෝගය | රෝගය | රෝග කාරකය | | |
|---|---|---|---|---|
| වී | දුඹුරු පුල්ලි | දිලීර | *Helminthosporium oryzae* |  |
| | පත්‍ර ලප | දිලීර | *Alternaria padwickii* |   |
| | බීජ පැළ අංගමාරය | දිලීර | *Fusarium* sp. |  |
| | කොළ පාළුව | දිලීර | *Pyricularia oryzae* |   |
| බඩඉරිඟු | කඳ කුණුවීම | බැක්ටීරියා | *Erwinia chrysanthemi* |   |
| | බීජ පැළ අංගමාරය | දිලීර | *Penicillium oxalium* |   |
| | බීජ රතු පැහැවීමේ රෝගය | දිලීර | *Fusarium moniliforme* |   |

| බෝගය | රෝගය | රෝග කාරකය | | |
|---|---|---|---|---|
| කුරක්කන් | කොළ පාළුව | දිලීර | *Pyricularia oryzae* |  |
| බෝංචි | ඇන්ත්‍රැක්නෝස් | දිලීර | *Colletotrichum gloeosporioides* |   |
| තක්කාලි | ඇන්ත්‍රැක්නෝස් | දිලීර | *Colletotrichum gloeosporioides* |  |
| | පූර්ව අංගමාරය | දිලීර | *Alternaria solani* | |
| | වෛරස් | වෛරස් | Tomato spotted wilt virus (TSWV) |  |
| | පිලිකා රෝගය | බැක්ටීරියා | *Clavibactermichi genensis* |  |
| ලූනු | දම් පැල්ලම් | දිලීර | *Alternaria porri* |  |
| | ඇන්ත්‍රැක්නෝස් | දිලීර | *Colletotrichum gloeosporioides* |  |

| බෝගය | රෝගය | රෝග කාරකය | | |
|---|---|---|---|---|
| මිරිස් | ඇන්ත්‍රැක්නෝස් | දිලීර | *Colletotrichum gloeosporioides, Colletotrichum capsici* |   |
| | පත්‍ර අංගමාරය | දිලීර | Alternaria solani | |
| උඳු | ඇන්ත්‍රැක්නෝස් | දිලීර | *Colletotrichum gloeosporioides* |  |
| මුං | ඇන්ත්‍රැක්නෝස් | දිලීර | *Colletotrichumlin demuthianum* |  |
| | දැල් අංගමාරය | දිලීර | *Rhizoctonia* sp. |  |
| සෝයා බෝංචි | බීජ දම් පැහැවීමේ රෝගය | දිලීර | *Cercospora kikuchii* |   |
| මාලු මිරිස් | ඇන්ත්‍රැක්නෝස් | දිලීර | *Colletotrichum gloeosporioides* |  |
| වම්බටු | ඇන්ත්‍රැක්නෝස් | දිලීර | *Colletotrichum gloeosporioides* |  |

| බෝගය | රෝගය | රෝග කාරකය | | |
|---|---|---|---|---|
| වම්බටු | ගෙඩි කුණුවීම | දිලීර | *Phomopsis vexans* |  |
| පිපිඤ්ඤා<br>වැටකොළු<br>පතෝල<br>කරවිල<br>වට්ටක්කා | වෛරස් | වෛරස් | *Zucchini yellow mosaic virus virus(ZYMV) Cucumber green mottle mosaic virus (CGMMV)* |  |
| පැණි කොමඩු | බැක්ටීරියා පැල්ලම් | බැක්ටීරියා | *Acidovoraxaven aesubspcitrulli* |  |

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාර බෝගය වන වී බෝගය ආශ්‍රිතව හඳුනාගත් බීජ මඟින් පැතිරෙන හානිදායක දිලීර රෝග මඟින් වී වගාවට ඇතිකරනු ලබන බලපෑම පිළිබඳව වැඩිදුර අධ්‍යයනයන් සිදුකරන ලදි. එම අධ්‍යනයන්හිදි, අදාල රෝගකාරක පිවීන්ගේ ආසාධනය, වී බීජවල පැළවීම සහ බීජ පැළවල දිරිය අඩුවීම සඳහා සෘජුවම හේතු වන බව හෙළිවී ඇත. එමෙන්ම, රෝගකාරක පිවීන් රහිත නිරෝගී බීජ වල ඉහළ පැළවීමේ ප්‍රතිශතයක් සහ වැඩි දිරියක් දක්නට ලැබුණි.

මෑතකදී බීජ සෞඛ්‍ය පරීක්ෂණ ඒකකය මඟින් පරීක්ෂා කරන ලද බීජ සාම්පල වල ඉහත දැක්වූ ඇතැම් රෝගකාරක පිවීන් ඉහළ ප්‍රතිශත වලින් වාර්තා වී ඇත. විශේෂයෙන් ආනයනික බීජ හරහා ඉහත වාර්තාවී ඇති සහ මෙතෙක් වාර්තා නොවූ ඉතාමත් හානිදායක රෝගකාරක පිවීන් ශ්‍රී ලංකාව තුළට ඇතුළුවීමේ සහ ව්‍යාප්තවීමේ දැඩි අවධානමක් පවති. එබැවින් බීජ නිෂ්පාදනය කරනු ලබන ආයතන සහ සියළුම ගොවි මහතුන් විසින් බීජ වගාව ආරම්භයේ සිටම බීජ මඟින් පැතිරෙන රෝග මර්ධනය පිළිබඳව විශේෂ අවධානයක් යොමුකිරීම මඟින් ගුණාත්මයෙන් උසස් බීජ අස්වැන්නක් ලබා ගත හැකිය. එමෙන්ම බීජ ආනයනය සිදුකරනු ලබන විවිධ සමාගම් මඟින් බීජ ආනයනය සිදුකිරීමට පෙර එම බීජ වල සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂාකර ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමුකිරීම ඉතාමත් වැදගත් වේ.

**ගොවිකම් සඟරාවට ගෙන ආවේ,**

**ආචාර්ය ලක්මිණී ප්‍රියන්තා - නියෝජ්‍ය අධ්‍යක්ෂ**

**රසිකා අතුකෝරල - පර්යේෂණ සහකාර**

**බීජ සහතික කිරීමේ සේවය, ගන්නෝරුව**